# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලද්.

නො. 8,865—1942ක්වූ පෙබරවාරි මස 13 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—කළුතර දිස්ත්‍රික්කයේ වෙල්ලන යන ගමේ සිංහල මිශ්‍ර පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වෙනි ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

මුල් පිඹුරේ නො. A 1,306. ගම—පහල නැබොඩ (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නාම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොලාබත්ඇස්ටේට් | වයස අවුරුදු 35ක්වූ රබර්ගස් 128ක් ඇති ඉඩම | රෝස්හෝ (ලංකාවේ සීමාසහිත) ඒජන්තවරු: කොළඹ පිහිටි සීමාසහිත රෝස්හෝ කොම්පැනිය | 1 0 27 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1942ක්වූ මාර්තු මස 14වෙනි දින පෙරවරු 10ගේ කාලයට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ පෙබරවාරි මස 9වෙනි දින
කළුතර කච්චේරියේදිය.

ජේ. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වර්යා.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පේරාදෙනිය-රම්බොඩ පාරේ 10වෙනි සැතපුම් කණුව හුදුරු වංගුව දියුණුකිරීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයවූ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලනය පිළිබඳ කාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

පිඹුරේ නො. A 783. ගම—කිරින්ද.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නාම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අගුරුමල්ලේගොඩ .. | වත්ත .. | (1) කොළඹ ඩී. ඇස්. ද සයිමන් දෙස්කර මහත්මයා, (2) ගම්පල ඩබ්ලිව්. ඇස් ද සයිමන් මහත්මයා, (3) මාදම්පේ ජී. ආර්. අම්බලවානර් මහත්මයා, (4) ගම්පල ජේ. ආර්. අම්බලවානර් මහත්මයා, (5) කඩුගන්නාව පී. ආර්. අම්බලවානර් මහත්මයා, (6) කඩුගන්නාවේ ඩී. ඩී. වනිගරත්න මහත්මයා, (7) කිරින්දේ පීටර් පෙරේරා මහත්මයා, (8) ගෙලිඔයේ පුංචිනෝනා හාමිනේ | 0 0 6·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 8ටේ කාලයට ගම්පල තානායම්පලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ ජනවාරි මස 31වෙනි දින
මහනුවර කච්චේරියේදිය.

ජේ. ඩබ්ලිව්. එච්. ඔ'රීගන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගම්පලවත්ත-බරයන්පාර සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "203වෙනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් පාලනය පිළිබඳ කාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A. 781. ගම—නාරන්පිට (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | නාමල්වෙලඋඩකලට .. | කුඹුර | .. ගම්පල එච්. සෑම් ද සිල්වා, එච්. වාස් ද සිල්වා හා එච්. සුගතපාල ද සිල්වා මහත්මි යන අය | 0 | 0 | 2·7 |

සිතියමේ නො. A 782.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | නාමල්වෙලඋඩකලට හා නාමල්වෙලයටිකලත | කුඹුර | .. ගම්පල එච්. සෑම් ද සිල්වා, එච්. වාස් ද සිල්වා හා එච්. සුගතපාල ද සිල්වා මහත්මි යන අය | 0 | 0 | 11·8 |
| 2 | දිමෙල හා හනරලියද්ද .. | එම | .. කොළඹ ඇප්. ඩබ්ලිව් ගුණසේකර .. | .. 0 | 0 | 19·4 |
| 3 | හපුගස්කුඹුර .. | එම | .. ගම්පල ඩබ්ලිව්. ඈස් ද සයිමන් .. | .. 0 | 0 | 6·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 8.30ත් කාලයට ගම්පල තානායම්පළේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමට අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ ජනවාරි මස 31වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ජේ. ඩබ්ලිව්. එච්. ඕ'රීගන්,
ආණ්ඩුවේ උප ඒජන්ත මමය.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මහනුවර දිස්ත්‍රික්කයේ තැඹිලිගල පාඨශාලව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයවූ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 795. ගම—තැඹිලිගල පල්ලේගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | කොටුවේවත්ත .. | ගෙයක් සහිතවත්ත .. | තැඹිලිගල පල්ලේගම පදිංචි කොටුවේවත්තේගෙදර සිංගිරා සහ කොටුවේවත්තේගෙදර කුඩාදූරයා | 0 | 1 | 37·5 |
| 2 | එම .. | වත්ත .. | තැඹිලිගල පල්ලේගම පදිංචි කොටුවේවත්තේගෙදර සිංගිරා, කොටුවේවත්තේගෙදර කුඩාදූරයා සහ කොටුවේවත්තේ ගෙදර සුමරතුරා | 0 | 0 | 11·62 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 9·30ත් කාලයට ගම්පල තානායම්පළේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ ජනවාරි මස 31වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ජේ. ඩබ්ලිව්. එච්. ඕ'රීගන්,
ආණ්ඩුවේ උප ඒජන්ත මමය.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මහනුවර දිස්ත්‍රික්කයේ ඇල්පිටියේ ආණ්ඩුවේ දෙමළ පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයවූ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් පාලනය පිළිබඳ කාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 780. ගම—ඇල්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | අඑත්ගම්මැහෙගෙකුඹුරෙවත්ත .. | ඉඩම | .. ඇල්පිටියේ කාදර් ලෙබ්බේ හබිබු ලෙබ්බේ | .. 0 | 0 | 1 |
| 2 | පුංචාවෙදගෙයිවත්ත .. | එම | .. ඇල්පිටියේ වී. ඒ. හබියාම්මදු ලෙබ්බේ | .. 0 | 0 | 2·5 |
| 3 | අඑත්ගම්මැහෙගේකුඹුරෙවත්ත .. | එම | .. ඇල්පිටියේ කාදර් ලෙබ්බේ හබිබු ලෙබ්බේ | .. 0 | 0 | 1·8 |
| 4 | පුංචිවෙදගෙයිවත්ත .. | එම | .. ඇල්පිටියේ වී. ඒ. හබියාම්මදු ලෙබ්බේ | .. 0 | 0 | 0·3 |
| 5 | හිප්පෙපාලවත්ත, පල්ලියේවත්ත .. | එම | .. ඇපිටියේ පල්ලියේ භාරකාරයෝ | .. 0 | 1 | 7·5 |
| 6 | අඑත්ගම්මැහෙගේකුඹුරෙවත්ත .. | එම | .. ඇල්පිටියේ කාදර් ලෙබ්බේ හබිබු ලෙබ්බේ | .. 0 | 0 | 34 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 10ත් කාලයට ගම්පල තානායම්පළේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ පෙබරවාරි මස 2වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ජේ. ඩබ්ලිව්. එච්. ඕ'රීගන්,
ආණ්ඩුවේ උප ඒජන්ත මමය.

---

මේ 1876ක්වූ අවුරුද්දේ හොම්බර 3ත් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කෝදගොඩ-දික්කුඹුර රෝඩ් කොම්පි පාර පල්ලම්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "Cap. 203 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 841. ගම—කිහිවල සහ කෝදගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | වෑතොට .. | බදුමෙන්බැදි උළුසෙවිලිකල ගෙයකින් කොටසක් .. | ඉමදුව කෝදගොඩ පදිංචි ජී. ඇල්. දෙහ් හෙන්ද්‍රික් අප්පුහාමි | 0 | 0 | 0·22 |
| 2 | මිදෙල්ලගහ ඔවිට | අතුසෙවිලිකළ මැටිගෙයක්ද, අවුරුදු 25ක් වයස්වූ පොල්ගස් 5ක්ද, අවුරුදු 20ක් වයස්වූ පුවක්ගස් 21ක්ද, අවුරුදු 8ක් වයස්වූ දෙල්ගස් දෙකක්ද, අවුරුදු 5ක් වයස්වූ කොස්ගස් 2ක්ද, අවුරුදු 5ක් වයස්වූ දෙහිගහක්ද, අවුරුදු 5ක් වයස්වූ ඇඹිල්දොඩම්ගස් 1ක්ද, අවුරුදු 20ක් වයස්වූ කපුගහක්ද තිබෙන වත්ත | කෝදගොඩ ඉමදුව බවුවත් තුඩාවෙ කන්කානන්ගම ගේ පේදිරිස් | 0 | 0 | 6·50 |
| 3 | තුඹිප්පේරුවත්ත | අවුරුදු 2ක් වයස්වූ පොල්පැළ 2ක්ද, අවුරුදු 5ක් වයස්වූ පුවක්ගස් 9ක්ද, අවුරුදු 1ක් වයස්වූ පුවක්පැළ 3ක්ද, අවුරුදු 3ක් වයස්වූ කුරුඳුපඳුරක්ද, අවුරුදු 7ක් වයස්වූ අඹ ගහක්ද තිබෙන වත්ත | ඉමදුව කෝදගොඩ පදිංචි ජිමි සෙනෙවිරත්න | 0 | 0 | 4·09 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ වෙනත් තමුන් වෙනුවට ක්‍රියාකාරණ අය වම් 1942ක්වූ මාර්තු මස 7වෙනි දින පෙරවරු 10ගේ කාලයමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අකාරයේ අයිතිවාසිකම්ද තියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1942ක්වූ පෙබරවාරි මස 3වෙනි දින
ගාල්ලේ කච්චේරියේදිය.

ඩී. ජී. ඇල්. මියෝ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

## රජසන්තක තේ ඉඩම් බදුදීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක තේ ඉඩම්වල 1942කේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of Tea bushes" එනම් "තේගස්වල ප්‍රයෝජනගැනීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලොප්එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වම් 1942ක්වූ මාර්තු මස 5වෙනි දින පෙරවරු 10 වනතුරු භාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් එවලේම ගෙවන්ට ඕනෑය.

5. කැලෑවට යන්වනොදී ඉඩම හොඳ අන්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමණාකරන කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ වහාම හෝ අවලංගුකලවිට, බදුකාරයා ඉඩම නිරවුල්ව බාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරණ තේ පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

වම් 1942ක්වූ පෙබරවාරි මස 6වෙනි දින
රත්නපුරේ කච්චේරියේදිය.

ඩී. වනසූරිය,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

මැදකෝරලේ.

| නො. | | රෙජිස්තර් නො. | | නම. | | ඉඩම්වල තොරතුරු. | | බිම්ප්‍රමාණය; අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | .. | SY 474A1, SY 474A2 | .. | බැරැන්දෙනිය .. | .. | 2 B. S. P. P. 468 | .. | 0 | 2 | 4 |
| 2 | .. | SY 1005 | .. | පල්ලේකන්ද .. | .. | 34 (කැල්ලක්) F. V. P. 478 | .. | 0 | 0 | 16 |
| | | | | කුරුවිටිකෝරලේ. | | | | | | |
| 3 | .. | SY 3022 | .. | පාතලස්සකන්ද | .. | 33 (කැල්ලක්) F. V. P. 328 | .. | 0 | 0 | 8 |
| 4 | .. | SY 2788 | .. | එම .. | .. | 25 (කැල්ලක්) F. V. P. 328 | .. | 0 | 2 | 0 |
| 5 | .. | SY 1586 | .. | මුරුත්තෙතවිටුවෙකන්ද | .. | 3 (කැල්ලක්) F. V. P. 391 | .. | 1 | 0 | 0 |
| 6 | .. | SY 2732 | .. | එම .. | .. | 65 (කැල්ලක්) F. V. P. 391 | .. | 1 | 0 | 0 |
| 7 | .. | SY 2226 | .. | පැලැන්දකන්ද .. | .. | 7 (කැල්ලක්) F. V. P. 394 | .. | 4 | 0 | 0 |
| 8 | .. | SY 3440 | .. | අඹවිකන්ද .. | .. | 199 V. P. 393 .. | .. | 2 | 1 | 18 |

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වම් 1912හේ අංක 8 දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීමයි.

### හලාවත දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් සම්බන්ධම් ඡන්දය විමසීම.

වම් 1925ක්වූ අගෝස්තු මස 14වෙනි දින අංක 7,478 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකල අංක 146 දරන මත්පැන් පිළිබඳ නියෝගය (අංක 180, 187, 194, 221, 225 සහ 231 දරන මත්පැන් සම්බන්ධ දැන්වීම්වලින් වෙනස්කල පරිදි) යටතේ පවරනලද බලය ප්‍රකාර, වම් 1942ක්වූ ජනවාරි මස 30වෙනි දින අංක 8,855 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ගරුතර ලංකාණ්ඩුකාර උතුමාණන් විසින් ඡන්ද විමසීමේ දිනය වම් 1942ක්වූ මාර්තු මස 9වෙනි දිනට කල්දමනලදැයි කල ප්‍රකාශයද අනුව වයඹ දිසාවේ පුත්තලම් හලාවත දෙදිසාවේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් මෙහි පහත උපලේඛණයේ සඳහන් තැබෑරුම් තිබෙන පලාතේ හිමිකැසි සහතිකකරනලද ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ නම් අඩංගු අයවලුන්ගෙන් සියයට හැට ගණනක් ඉරවිටකුලමේ රා තැබෑරුම වෙනුවෙන් නැවත අවසර පත්‍රයක්දීම ගැන කැමතිද යන බව ඡන්දය ගැනීමේ ක්‍රමයෙන් දැනගැනීම සඳහා මෙහි පහත සඳහන් දිනය සහ ස්ථානය නියමකර තිබෙන බව මෙයින් දන්වනු ලැබේ.

වම් 1942ක්වූ පෙබරවාරි මස 10වෙනි දින
පුත්තලම් කච්චේරියේදිය.

ආර්. මොහිපෙති,
ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

ඡන්දය ගනු ලබන වේලාව : උදේ 8 සිට 12 දක්වා සහ පස්වරු 1 සිට 6 දක්වාත්ය.

| තැබෑරුමේ නම. | ඡන්දයගනු ලබන දිනය. | ඡන්දය ගනුලබන ස්ථානය. | කොට්ඨාශය. |
|---|---|---|---|
| ඉරවිටකුලම රා තැබෑරුම | වම් 1942ක්වූ පෙබරවාරි මස 9වෙනි දිනදිය. | මාදම්පේ ගම්සභා උසාවිය | ඌරලියාගාර ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) ඌරලියාගාර, (2) මැල්ලවගාර (3) හොරකැලේ. ඉහලගම් ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) ඉහලගම, (2) ඉරවිටකුලම, (3) ගලහිටියාව. මරක්කලගම් ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) මරක්කලගම, (2) කඩම්දිය, (3) දුරගම, (4) දුරගම කඩවිදිය. පච්චියගම ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) පච්චියගම, (2) එගොඩයාගම. පූකුලම ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) පූකුලම. මහබැද්දේගම ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) මහබැද්දේගම. පාම්බල ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) පාම්බල. කරුක්කුව ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) කරුක්කුව. හෙළම්පොකුණ ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) හෙළම්පොකුණ. උතුරු හෝමුවාව ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) ඌරු හෝමුවාව, (2) ඉරනවිල. දකුණු හෝමුවාව ගම් මූලාදැනියාගේ කොට්ඨාශය: (1) දකුණු හෝමුවාව |

## උපාඩිග නීති.

M. L. A.—B 1900/L. D.—B 201/41

### (මස් පිණිස) සතුන් මරන්නන් පිළිබඳ අඥාපනත.

(මස් පිණිස) සතුන් මරන්නන් පිළිබඳ අඥාපනතේ (201 පරිච්ඡේදයේ) 22වෙනි වගන්තිය යටතේ ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ නියම අධිකාරි මණ්ඩලයවූ රත්නපුරේ නගරබද සභාව විසින් සම්පාදනයකරනලදින් ආණ්ඩුකාරයාණන්වහන්සේ විසින් එකී වගන්තියෙන් උන්වහන්සේ කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර ස්ථිරකරනලද ව්‍යවස්ථාවයි.

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක,
ප්‍රදේශ පාලනය පිළිබඳ අමාත්‍යතැන.

1942ක්වූ පෙබරවාරි මස 11 වැනි දින
කොළඹදීය.

ව්‍යවස්ථා.

1941 නොවැම්බර් මස 21වැනි දින අංක 8,815 දරන ගැසට් පත්‍රයේ පළවූ සතුන් මරන ස්ථාන පිළිබඳ ව්‍යවස්ථා, එහි 12වැනි ව්‍යවස්ථාවෙහි "1940 මාර්තු මස 11වැනි දින" යන ඉලක්කම හා වචන ඉවත්කොට ඒ වෙනුවට "1910 මාර්තු මස 11වැනි දින" යන ඉලක්කම හා වචන යෙදීමෙන් මෙයින් සංශෝධනයකරනු ලැබේ.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.